රත්තොට ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු.418,068 ක් වටිනා ලීබඩු හා සවිකිරීම් සහ යන්ත්‍ර හා උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ආ) | 2017 හා 2018 වර්ෂවල ක්‍රියාත්මක කර තිබූ රු.4,763,691 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 15 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වටිනාකම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.277,559 ක් වටිනා ගොඩනැගිලි 5 ක් භෞතිකව නොපැවතුණි. | භෞතිකව නොමැති වත්කම් සම්බන්ධව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ඈ) | කුරුවාව කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැයකළ රු.492,910 ක් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2014 දෙසැම්බර් 30 වන දින කුරුවාව ළමා උද්‍යානය සඳහා මිලදී ගෙන තිබූ රු.975,000 ක් වටිනාකමින් යුතු සෙල්ලම් උපකරණ, ලී බඩු හා සවිකිරීම් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ගබඩා ණයහිමි ශේෂය රු.9,647,470 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම සහ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.179,802 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයගැති ශේෂය රු.713,735 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ පොදු ගබඩා ශේෂය රු.56,243 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

------------------------

| ගිණුම් විෂයය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.85,939,094 ක් වූ ගිණුම් විෂයන් 07 ක් අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී එකතුව රු.19,654,902 ක නොසැසඳීමක් පැවතුණි. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.3 අවිනිශ්චිත ගිණුම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1997 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.15,462 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වල අවශ්‍යා ගැළපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතු වේ. | පිළිගනිමි. |

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ශේෂවල එකතුව රු.4,467,019 ක් විය. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | | |
| වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ශේෂයන්ගේ එකතුව රු.6,744,609 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.202,427,244 ක් වූ ගිණුම් විෂයයන් 8 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ලේඛන යාවත්කාලීනව සම්පූර්ණකර ඉදිරිපත් කිරීම, ශේෂ සනාථ කිරීම් හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | පාරවල් සහ පටු මංමාවත්වල නාම ලේඛනයක් සහිත මාර්ග ඉන්වෙන්ට්‍රියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | කඩිනමින් මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස්කර එය යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | ඉදිරියේදී මාර්ග සමීක්ෂණය කොට මාර්ග සිතියම්ගත කිරීම, මාර්ග මායිම් සලකුණු කිරීම හා ඊට අදාළ පිඹුරුපත් සකස් කර මාර්ග සමීක්ෂණය කිරීමට මේ වන විට සැලසුම් කොට ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් සමීක්ෂණයක් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය සිදු කළ යුතු වේ. | වත්කම් විෂයය අදාළ ලේඛන ඒ වන විට යාවත්කාලීන වී නොතිබූ නිසා ස්ථාවර වත්කම් පරීක්ෂාවක් සිදු කිරීමට නොහැකි වූ අතර මේ වන විට ඒ සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති හෙයින් සියලු ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂා කිරීම ආරම්භ කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,204,547 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,638,851 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,528,832 | 9,594,613 | 9,506,423 | 9,390,459 | 8,012,000 | 9,291,442 | 7,728,989 | 9,421,822 |
| (ii) | කුලී | 3,024,580 | 2,815,531 | 2,646,529 | 1,402,757 | 2,220,000 | 2,524,800 | 2,051,685 | 1,233,756 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 750,000 | 902,625 | 902,625 | - | 900,000 | 992,460 | 992,460 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,090,678 | - | 4,634,022 | - | 4,943,000 | - | 5,715,639 | - |
| | එකතුව | 25,394,090 | 13,312,769 | 17,689,599 | 10,793,216 | 16,075,000 | 12,808,702 | 16,488,773 | 10,655,578 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,219,752 ක් වී තිබූ අතර, රජයේ ආයතනවලින් අය විය යුතු හිඟය රු.151,201 ක් විය. | 2015/08 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | ආයතන 11 කට අයත් රු.136,492 ක මුදලක් කපා හැරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර ඇත. මේ වන විට ආයතන 8 කට අදාළ රු.8,401 ක මුදලක් අය කර ඇත. |

### 2.2.3 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.392,180 ක අක්කර බදු ශේෂයක් අය නොවී පැවතුණි. | අක්කර බදු සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර ලේඛන යාවත්කාලීන කර බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ අක්කර බදු අයකිරීම සඳහා ගැසට් කර නොමැති බැවින් හා ලේඛනයේ දක්වා ඇති දේපළ හෙක්ටයාර 5 ට අඩු බැවින් අක්කර බද්දට යටත් නොවේ. එම නිසා මෙම දේපළ සම්බන්ධයෙන් මේ වන විට සමීක්ෂණයක් සිදු කරමින් පවතී. |

2.2.4 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.7,778,168 ක් විය. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

2.2.5 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේනිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,402,757 ක හිඟ කඩ කුලී අය නොවී පැවති අතර එම ශේෂය තුළ වර්ෂයකට වැඩි කාලයකට අදාළව රු.634,623 ක ශේෂයක් පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ කඩකාමර බදු දීම සම්බන්ධ චක්‍රලේඛයේ 5(i) ඡේදය අනුව සභාව සතු කඩ කාමර 91 ක කුලිය වසර 5 කට වරක් සංශෝධනය කර නොතිබුණි. | තක්සේරු වාර්තා ලබා ගැනීම හා ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ. | ටී.ඩී.ජයරත්න මාවත, රංජන් විජේරත්න මාවත, නිකලොය පාර සතිපොළ, නිකොලය පාර නව වෙළඳ සංකිර්ණය යන ස්ථානවල පිහිටා ඇති කඩ කාමරවලට අදාළ තොරතුරු තක්සේරු නිලධාරීන් විසින් ලබාගෙන ගියද තක්සේරු වාර්තා අප වෙත ලබා දී නොමැත. |
| (ඇ) | කාන්තා වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ 26 දරන කඩකාමරයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.300,000 ක අවම ලංසුවෙන් අය විය යුතු ඉතිරි රු.200,000 ක මුදල අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම කඩකාමර බදුකරුවන්ට ලබා දෙන ලද්දේ රුපියල් ලක්ෂයක් පළමුව ලබා ගෙන ඉතිරි රුපියල් ලක්ෂ 2 ක මුදල පසුව ලබාදීමේ පදනමින් වන අතර, එවකට සභාපතිතුමාගේ 2007 මාර්තු 22 දිනැති ලිපිය මගින් එම කඩ කාමරය වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදලක් සභාවේ තැන්පත් කරන ලෙස ස.ණ.ස. සභාපතිවරයාට ලිඛිතව දන්වා ඇත. ඒ අනුව 2019 මාර්තු 21 දිනැති ලිපිය මගින් ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. |

2.2.6 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.405,686 ක් වී තිබුණි. | හිඟ ගාස්තු අය කර ගැනීම කළ යුතුවේ. | මෙම හිගය ප්‍රාදේශීය සභා සංස්ථාපනය වීමට පෙර සිට පැවතෙන අතර බලපත්‍ර ලබා දිය යුතු ස්ථාන හෝ පුද්ගලයන් සම්බන්ධ ලේඛන සභාව සතු නොපවතී. එබැවින් මෙම හිඟය ලේඛන වලින් කපා හැරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යැවීමට කටයුතු සූදානම් කොට ඇත. |

2.2.7 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කයිකාවල පෙල්ස්ෆා ප්‍රවාහනය කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතන 4 කින් 2016 සිට 2018 දක්වා අය විය යුතු රු.112,000 ක ආදායමක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟය පියවා ගැනීම සඳහා අදාළ ආයතනවලට ලිපි මඟින් දැනුවත් කර ඇති අතර ඉදිරි කාලය තුළ ඉතා කඩිනමින් එම මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් සහා අරමුදලින් ක්‍රියාත්මක කළ යුතු ලෙස | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සහා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ යෝජනා ක්‍රියාත්මක |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන තිබූ සංවර්ධන යෝජනා 15 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | කිරීමට නොහැකි වූයේ නව සභාව පත්වීමත් සමඟ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ යෝජනා ඇතුළත් වෙනම සැලැස්මක් සකස් කර අනුමත කිරීම නිසාය. |

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතු වන කසළවලින් ටොන් 1.25 ක් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා යොදවා ගෙන ඉතිරි කසළ පරිසරයට හානිවන ආකාරයෙන් බැහැර කරමින් පැවතුණි. | දිරන කසළ කොම්පෝස්ට් නිෂ්පාදනය වැනි විකල්ප කාර්යයන් සඳහා යෙදවීම කළ යුතු වේ. | කසළ කළමණාකරන මධ්‍යස්ථානයේ සේවයට සේවකයින් 03 ක්වත් අවම වශයෙන් සිටිය යුතුයි. දැනට ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත සෞඛ්‍ය කම්කරුවන් 5 දෙනෙකු ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2016 සහ 2017 වර්ෂවලදී රු.1,801,826 ක් වැය කර ඉදිකිරීම් අවසන් කර තිබූ කුරුවාව කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානයේ විධිමත් පරිදි කසළ වෙන් කර විකිණීම මඟින් ආදායම් උපයා ගැනීමේ ක්‍රමවේදයක් ආරම්භ කර නොතිබුණි. | කසළ බැහැර කිරීම කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කළ යුතු වේ. | කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානය වෙත තෝරාගනු ලබන පොලිතින් ප්ලාස්ටික් කාඩ්බෝඩ් ගෙන එන අතර ඒවා ඉදිරියේදී අලෙවි කිරීමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාර තිරසර සංවර්ධන ඉලක්ක සඳහා සැලසුම් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව තිරසර සංවර්ධන ඉලක්ක ගොඩනගාගෙන ක්‍රියාත්මක කළ යුතු වේ. | සංවර්ධන හා වෙනත් සැළසුම් සකස් කිරීමේදී තිරසර සංවර්ධන ඉලක්ක සෘජුවම දක්වා නොතිබුණද පළාත් පාලන ආයතන විෂය ක්ෂේත්‍රයන් වන මහජන සෞඛ්‍ය, පොදු මංමාවත්, සනීපාරක්ෂාව සහ පොදු උපයෝගීතා ප්‍රදේශයේ තිරසර සංවර්ධනයට දායක වන යෝජනා ප්‍රමුඛගත කොට අයවැයට ඇතුළත් කොට ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව ඉදිරි සැළසුම් සකස් කිරීමේදි තිරසර සංවර්ධන ඉලක්ක අරමුණු කොට සැලසුම් සකස් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1999 සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ විවිධ අවස්ථාවන්හිදී ගෙවා තිබූ රු.174,687 ක් අත්තිකාරම් ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් නිරවුල් කළ යුතු වේ. | පිළිගනිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | අනුමත කාර්යමණ්ඩලය තුළ තනතුරු 09 ක පුරප්පාඩු 19 ක් හා තනතුරු 4 ක අතිරික්තතා 06 ක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමටත් අතිරික්ත තනතුරු විධිමත් කිරීමටත් කටයුතු කළ යුතු වේ. | මෙම ප්‍රාදේශිය සභාවේ තාක්ෂණ නිලධාරි (විශේෂ ශ්‍රේණිය) සහ සංවර්ධන නිලධාරි පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කරදෙන ලෙස මා විසින් පළාත් පාලන කොමසාරිස් මඟින් ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලදී. |
| (ආ) | දීර්ඝ කාලයක සිට පැවත එන සේවය හැර ගිය හා මියගිය නිලධාරීන් හය දෙනෙකුගෙන් අය විය යුතු රු.56,156 ක ණය ශේෂයක් අය කර ගෙන නොතිබුණි. | ණය ශේෂ කඩිනමින් අය කළ යුතු වේ. | 2018 සැප්තැම්බර් 30 වන විට විශ්‍රාම ගිය, සේවය හැරගිය සහ මියගිය නිලධාරින්ගෙන් අයවිය යුතු රු.56,156.41 ක් වූ ණය ශේෂ අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

3.4 වත්කම් කළමනාකරණය

------------------------------

නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | ------------------------------- |
| (අ) | කම්බිඅඩිය පුස්තකාල භූමියේ පිහිටා ඇති ප්‍රජාශාලාව වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රජාශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම් සම්පූර්ණ කර අරමුණුගත කාර්යයන්ට යොදවා ගැනීම කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී සභාවේ ආදායම් තත්ත්වය අනුව එම ප්‍රජාශාලාවේ ඉතිරි වැඩ නිම කිරීමට මුදල් වෙන්කර අදාළ වැඩ නිමකර ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදවා ගන්නා බව දන්වමි. |
| (ආ) | 2017 ජනවාරි 18 වන දින පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ලැබී තිබූ රු. 500,000 ක් වටිනා බ්‍රේල් යන්ත්‍රයක් කොම්පෝස්ට් අංගනයේ ස්ථාපිත කර තිබුණ ද ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. | ඵලදායීව යොදවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.12,751,577 ක් වැය කර 2015 මාර්තු 16 දින ඉදිකිරීම් අවසන් කර තිබූ දෙමහල් සතිපොළ ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයන්ට යොදවා ගත යුතු වේ. | මෙම ගොඩනැගිල්ලේ පහළ මාලය කඩ කාමර බවට පත්කර ඉදිරියේදී ටෙන්ඩර්කර ලබා දීමට නියමිත අතර එහි ඉහළ මාලයේ 2019 අප්‍රේල් 08 දින සිට රත්තොට මහජන පුස්තකාලය පවත්වාගෙන යන බව දන්වමි. |
| (ඈ) | භාවිතයට ගත නොහැකි රු.944,400 ක් වටිනා වාහන 7 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ. | මෙම වාහන සියල්ලම විකිණීම සඳහා මිල ගණන් කැඳවූ අතර **57-5736** නිසාන් ඇට්ලස් කැබ් රථය මේ වන විටත් රු.786,000 ක මුදලට විකුණා ඇත. ඉතිරි වාහන ඉවත් කර ගැනීම ලන්සුකරුවන් ප්‍රතික්ෂේප කර ඇති බැවින්, එම වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

3.5 ප්‍රසම්පාදනය
----------------
ප්‍රසම්පාදන සැලැස්ම
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------ |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 උපදෙස් ක්‍රියාත්මක කළ යුතු වේ. | 2019 වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන බව දන්වා සිටිමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------
විගණන හා කළමනාකරණ කමිටු
---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------ |
| සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම කළ යුතු වේ. | 2018 වර්ෂයේ 1 වෙනි කාර්තුවේ පමණක් කමිටු පැවැත්වූ අතර 2019 වර්ෂයේ නියමිත පරිදි කමිටු පැවත්වීමට කටයුතු කරන බව දන්වමි. |